# සිංහල සංස්කෘතික ගුණාංග පිළිබඳ සටහනක්

චන්ද්‍රසිරි පල්ලියගුරු

Emergence of a Value system and social norms among Sinhala Buddhists are centered on the beliefs of 'Karma' and 'Re-birth'. Social norms of a society change due to socio-economic factors, but change in values occur not so rapidly as social norms. It is necessary for a society to make people conscious about social values when it faces the danger of disappearing social norms. This was done by preachers, writers as well as opinion leaders of society when the need arises. Social values of the Sinhalese can be identified as 'national characteristics'. These national characteristics developed within Sinhala society due to three major factors. They are (1) community life which sprang as a result of 'vapi' (tank) culture, (2) the pattern of free thinking due to religious freedom given to them by Buddhism and (3) freedom of adaptability. Ancient Sinhala society was formed by a triangle of the king, the populace, and the Sangha where by the continuity of social values mainly depended on religion. One cannot see a difference in Sinhalese and Buddhist social values because they are one and the same.

මෙම කෙටි සටහනෙන් සංස්කෘතියෙහි දක්නට ලැබෙන **ලක්ෂණ** හා **ගුණාංග** අතර පවත්නා **සම්බන්ධය** හා **විශේෂතා** පිළිබඳ අවධානය යොමු කරන්නට වෑයම් කරමු. අප දන්නා පරිදි ඒ ඒ සංස්කෘතීන් හි ඒවාට ම විශේෂ වූ ගති ස්වභාවයන් දක්නට ලැබේ. මෙම ගති ස්වභාවයන් ඇතිවීමට හේතු කිහිපයකි. ඉන් පළමුවැන්න වන්නේ **දේශ ගුණික** හා **භෞතික තත්ත්වය** යි. දෙවැන්න වන්නේ **චෛතසික ස්වභාවය** යි. මෙම කරුණු දෙක කෙරෙහි අවධානයෙන් තොර ව සංස්කෘතික ගුණාංග පිළිබඳ ව අවධානය යොමු කළ නො හැකි වන්නේ ය. අපරදිග සංස්කෘතියෙහි දක්වෙන **පුද්ගල මූලිකත්වයත්** පෙරදිග සංස්කෘතියෙහි දක්නට ලැබෙන **විශ්ව මූලිකත්වයත්** පිළිබඳ ස්වභාවයන් ආශ්‍රයෙන් සංස්කෘතික ගුණාංග පිළිබඳ ව මූලික හැඟීමක් ඇති කොට ගැනීමට වෑයම් කරමු.

සංස්කෘතික ගුණාංග පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී අපට වැදගත්වන සාධකයක් වන්නේ මූලික වශයෙන් සමාජය පිළිබඳ ව අවධානය යොමු කිරීම ය. එයට හේතුව සංස්කෘතිය පහළ වන්නේ සමාජය පදනම් කොට ගෙන නිසා ය. මානව විද්‍යාවෙහි හෝ සමාජ විද්‍යාවෙහි සමාජය යන පදය වහරනු ලබන්නේ, '**පුද්ගලයන් හෝ මිනිස් කණ්ඩායම්**